**පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2017**

**------------------------------------------------------------**

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1985 අංක 02 දරන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 මතය

---------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

--------------------------------------------

#### 2.2.1 නොසැසඳු පාලන ගිණුම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව වත්කම් අයිතම 4 ක පිරිවැය හා අත්පත්කර ගැනීම්වල වටිනාකම පිළිවෙලින් රු.50,137,844 ක් හා රු.1,245,002 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එම වටිනාකම පිළිවෙලින් රු.51,361,231 ක් හා රු.1,292,307 ක් වූයෙන් රු.1,223,387 ක හා රු.47,305 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රකාශන තොගවල වටිනාකම රු.1,350,697 ක් වුවත් ආයතනයේ පොත්පත් අනුව එහි වටිනාකම රු.931,372ක් වූයෙන් රු.419,325 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දැක්වෙන ව්‍යාපෘති සඳහා ලබාදුන් අත්තිකාරම් ශේෂ 5 ක එකතුව රු.1,876,489 ක් නිරවුල් කිරීමෙන් තොරව වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) ආයතනයේ සේවය කළ කථිකාචාර්යවරයෙකු 2014 ඔක්තෝබර් 19 දින සේවය අතහැර ගොස් තිබුණු අතර ඔහුගෙන් අයවිය යුතු ආපදා ණය ශේෂය රු.208,636 ක් 2018 ජූනි 30 දින වනවිටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල වෙනත් වගකීම් යටතේ දැක්වෙන නිමකර වර්ෂ 4 ක් ගතවී ඇති පර්යේෂණ ව්‍යාපෘති දෙකකට අදාළ එකතුව රු.215,517 ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,893,052 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,761,480 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 868,428 කින් අඩුවී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.4,879,000 කින් වැඩිවීම හා වර්ෂයේ වියදම රු.1,838,539 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි විශේෂයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් රු.1,823,191 ක් හා රු.6,412,197 ක ඌනතාවයක් පැවතියද 2015 වර්ෂයේදී රු.4,059,619 ක අතිරික්තයක් ඇතිවී තිබුණි. නැවත 2016 වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.3,761,480 ක් හා රු.2,893,052 ක ඌනතාවයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.26,278,680 ක් වූ දායකත්වය 2017 වර්ෂය වනවිට රු. 48,101,134 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක පීඑෆ්ඩී/ආර්ඊඩී/01/04/2014/01 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01 අනුව පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මේ කාලරාමුව සකස් කර තිබුණද එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත ප්‍රතිඵලය සඳහන් කර නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 ඡේදය අනුව ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය කාර්තුමය වශයෙන් සකස් කර නොතිබුණි.

**4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

පුරාවිද්‍යා පිළිබඳ පශ්චාත් උපාධි තත්ත්වයේ ඉගැන්වීම හා වෘත්තීය පුහුණුව ආයතනයේ නියමාවලියේ දැක්වෙන ප්‍රධාන කාර්යයන් විය. ආයතනය විසින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා 02 ක් හා ශාස්ත්‍රපති පාඨමාලා 05 ක් පවත්වා තිබුණු අතර අධ්‍යයන වර්ෂ 04 ක ශිෂ්‍ය ලියාපදිංචිය හා විභාගය සමත් සංඛ්‍යාව පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014, 2015, 2016 හා 2017 වර්ෂවල ශිෂ්‍ය ලියාපදංචිය පිළිවෙලින් 100 ක්, 63 ක්, 82 ක් හා 101 ක් විය. මේ අනුව 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ ශිෂ්‍ය ලියාපදිංචිය අඩුවී තිබුණත් 2017 වර්ෂය වනවිට නැවතත් 101 ක් දක්වා වර්ධනය වී තිබුණි.

(ආ) විභාග සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පිළිවෙලින් 38 ක්, 35 ක්, 49 ක් හා 72 ක් වූ අතර 2014 වර්ෂයේ සියයට 38 ක්වූ සමත්වීමේ ප්‍රතිශතය 2017 වර්ෂය වනවිට සියයට 71 ක් දක්වා වර්ධනය වී තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ ආයතනයේ විවිධ පශ්චාත් උපාධි පාඨමාලා සම්පූර්ණ කර තිබුණු සිසුන් 89 දෙනෙකු වෙනුවෙන් 2018 මැයි 30 දින වනවිටත් උපාධි ප්‍රදානෝත්සව පවත්වා නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) පුරාවිද්‍යාඥයෙකු විසින් පුරාවිද්‍යාව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රදර්ශනය කිරීම සඳහා 2011 වර්ෂයේ ආයතනයට පරිත්‍යාග කර තිබුණු පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් භාණ්ඩ විශාල සංඛ්‍යාවක් ආයතනයේ එවකට සිටි අධ්‍යක්ෂවරයා වෙත භාර දී තිබුණ ද එම භාණ්ඩ වසර 6 කට ආසන්න කාලයක් ඔහුගේ නිළ කාමරයේ තබා තිබුණි. මෙම භාණ්ඩ ඉතා ඉක්මනින් කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත භාරදීමට කටයුතු කරන බව ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් විගණනය වෙත දැනුම්දී තිබුණි.

(ආ) අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව අලෙවිය සඳහා පොත් හා ප්‍රකාශන මුද්‍රණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.1,350,697 වූ පොත් 2497 ක් ඉතිරිවී තිබුණි. වර්ෂය තුළදී රු.65,169 ක් වටිනා පොත් 50 ක් පමණක් අලෙවි වී තිබුණි.

(ඇ) ආයතනයේ වර්තමාන සැපයුම්කරුවකු වන විදේශීය සමාගමකින් පොත් හා වාර සඟරා මිලදී ගැනීමට 2006 වර්ෂයේ රු.63,845 ක බැංකු අනකරයක් නිකුත් කර තිබුණද ඊට අදාල පොත් 2018 ජුනි 30 දක්වාම ආයතනයට ලැබී නොතිබුණි. මෙම සැපයුම්කරු වර්තමානයේදීද මෙම අත්තිකාරම හැර අනෙකුත් සියලු අත්තිකාරම් වෙනුවෙන් අප්‍රමාදව සැපයුම් සිදුකර තිබුණි.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ ඉගැන්වීම් උපකරණ සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානවලින් සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.2,935,820 ක වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂයක් පැවති අතර වර්ෂය ආරම්භයේදී ප්‍රමාණවත් මුදල් තිබියදී සමාලෝචිත වර්ෂයේදී රු.500,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ලබාගෙන තිබුණි. ඒ අනුව වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන වැය රු.879,661 ක් වීම හේතුවෙන් වර්ෂය අවසානයේ රු.2,556,159 ක ප්‍රාග්ධන ප්‍රදාන ඌන උපයෝජිතව පැවතුණි.

**4.4 ඌන උපයෝජිත වත්කම්**

---

ආයතනය සතු බැංකු ජංගම ගිණුම් දෙකක 2017 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.4,564,755 ක හා රු.5,338,930 ක ශේෂයක් පැවතුන අතර මෙම ගිණුම් දෙකෙහි වර්ෂය තුළ පිළිවෙලින් රු.6,065,743 ක හා රු.6,292,205 ක සාමාන්‍ය ශේෂයක් පැවතීමෙන් ජංගම ගිණුම්වල නිෂ්ක්‍රීය මුදල් ශේෂ පවතින බව නිරීක්ෂණය විය.

**5. තිරසාර සංවර්ධනය**

---

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---

**6.1 අයවැය පාලනය**

---

2017 වර්ෂයේ පිළියෙල කර තිබූ අයවැය ලේඛනය අනුව තත්‍ය අගයන් සහ අයවැයගත අගයන් අතර සියයට 40 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය සාර්ථක කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**7. පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂකගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | - | භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමට ප්‍රමාද වීම සහ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම. |
| (ආ) | අරමුදල් උපයෝජනය | - | අරමුදල් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කිරීම මඟින් අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ශිෂ්‍යයන් බඳවා ගැනීම | - | වසරින් වසර අඩුවන ශිෂ්‍ය ලියාපදිංචිය වැඩිකර ගැනීමේ සැලසුම් සකස් නොකිරීම. |